# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 1981/22 - 2016 අගෝස්තු මස 22 වැනි සඳුදා - 2016.08.22**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

*මගේ අංකය* : IR/15/35/2009

**කාර්මික ආරාවුල් පනත - 131 වැනි අධිකාරය**

131 වන අධිකාරිය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2012.06.08 දිනැති හා අංක 1761/21 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2012.05.10 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් කඩවත, මහර, සිරිමාවෝ බණ්ඩාරනායක මාවත, අංක 207/4හි පදිංචි මාග්‍රට් වෛද්‍යරත්න මිය හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 10, ටී. බී. ජයා මාවත, අංක 500හි පිහිටි ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2016.05.26 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එම්. ඩී. සී. අමරතුංග,
කම්කරු කොමසාරිස්.

2016 අගෝස්තු මස 15 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

කාර්මික අධිකරණයේ දී ය.

මාග්‍රට් වෛද්‍යරත්න,
අංක 207/4, සිරිමාවෝ බණ්ඩාරනායක මාවත,
මහර,
කඩවත.

නඩු අංකය : ඒ 3451 සහ

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය,
අංක 500, ටී. බී. ජයා මාවත,
කොළඹ 10.

අතර කාර්මික ආරාවුල

**ප්‍රදානය**

1957 අංක 14 හා 1957 අංක 62, 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ශ්‍රී ලංකා ව්‍යවස්ථාපිත අණ පනත් වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වගන්තියෙන් කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යවරයාට පැවරී ඇති බලතල යටතේ අමාත්‍යවරයා විසින් මාග්‍රට් වෛද්‍යරත්න මහත්මිය හා ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය අතර වූ කාර්මික ආරාවුල බේරුම් කිරීම සඳහා 2012.05.10 වන මා වෙත යොමු කරන ලදී.

මහවැලි අධිකාරිය විසින් 1999.07.15 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්) තනතුරේ වැඩ බැලීම සඳහා පත් කරනු ලැබ ඇති මාග්‍රට් වෛද්‍යරත්න මහත්මිය එම දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි එකී තනතුරේ ස්ථිරත්වය ලබාදී, ඒ අනුව හිඟ වැටුප් හා දීමනා ලබාදෙන ලෙසට ඇය විසින් කර ඇති ඉල්ලීම යුක්ති සහගත ද යන්න සහ යුක්ති සහගත වන්නේ නම් ඇයට හිමිවිය යුතු සහන මොනවාද යන්න කාර්මික අධිකරණය විසින් විභාග කර තීරණය කළයුතු කරුණ විය.

ඉල්ලුම්කාරිය දුන් සාක්ෂිය අනුව ද, නඩු විභාගයේ දී ඉදිරිපත් කරන ලද ලේඛන අනුව ද, ඇය 1985.02.01 දින මහවැලි අධිකාරියේ III වන ශ්‍රේණියේ ගණකාධිකාරී ධූරයට පත් කර ඇත. 1986.02.01 දින සිට II ශ්‍රේණියේ ගණකාධිකාරී ධූරයට ද, 1990.01.01 දින සිට I ශ්‍රේණියේ ගණකාධිකාරී ධූරයට ද උසස් කර ඇත.

එසේම, 1995.07.01 දින සිට ඇය සහකාර අධ්‍යක්ෂ (මුදල්) තනතුරට පත් කර ඇත.

වෛද්‍යරත්න මහත්මිය සහකාර අධ්‍යක්ෂ (මුදල්) තනතුරේ කටයුතු කරමින් සිටියදී ඇය සහ තවත් සේවකයින් තිදෙනෙකු ප්‍රතිව්‍යූහගත කරන අංශය වෙත 1998.06.11 වන දින සිට වහා ක්‍රියාත්මක වන පරිදි මාරු කර යවා ඇත. ඒ බව ''x2'' වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරන ලද 1998.06.11 දින දරන ලිපියෙන් ද මහවැලි අධිකාරිය විසින් ''වී.2'' ලෙස ලකුණු කර ඉදිරිපත් කරන ලද ලේඛනයෙන් ද තහවුරු වේ. එසේම මහවැලි අධිකාරිය විසින් මෙම නඩු විභාගයේ දී ''වී8'' ලෙස ලකුණු කර ඉදිරිපත් කරන ලද එම අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් 2002.09.26 දාතමින් වෛද්‍යරත්න මහත්මිය වෙත යවන ලද ලිපිය කෙරේ අවධානය යොමු කළෙමි. එම ලිපියේ සඳහන් වන්නේ වෛද්‍යරත්න මහත්මිය 1998.06.12 වැනි දින සිට වැටුප් රහිත නිවාඩු මත මහවැලි ප්‍රතිව්‍යූගත කරන හා පුනරුත්ථාපන ව්‍යාපෘතියට මුද හැරීම අනුමත කරන බවයි. එම ලිපියේ දැක්වෙන ආකාරයට,

i. එම ව්‍යාපෘතියේ සේවය කරන කාලය තුළදී වෛද්‍යරත්න මහත්මියගේ පරිපාලනමය හා මූල්‍යමය කටයුතු වලින් අධිකාරිය සම්පූර්ණයෙන් නිදහස් වන බව.

ii. ව්‍යාපෘතියේ සේවය කරන වැටුප් රහිත සේවා කාලය අධිකාරියේ සම්පූර්ණ කාලයට ගණනය නොවන බව.

iii. ව්‍යාපෘතියේ ගණකාධිකාරී ලෙස සේවය කිරීම වෙනුවෙන් 1998.09.29 වැනි දින සිට 2000.12.31 දක්වා කළමණාකරණ සේවා අංක 79, 3, 1 :1 ට අනුව රුපියල් හතලිස් දහසක (රු. 40,000) ක වැටුපක් ද, කළමනාකරණ සේවා අංක 10, 5:1 අනුව 2001.01.01 දින සිට රුපියල් හැට දහසක (රු. 60,000) ක වැටුපක්ද ගෙවන බව.

වෛද්‍යරත්න මහත්මිය වැටුප් රහිත නිවාඩු මත 1998.06.12 වැනි දින සිට ප්‍රතිව්‍යූහගත කරන හා පුනරුත්ථාපන ව්‍යාපෘතියේ සේවයට ගොස් ඇත්තේ ඉහත සඳහන් කොන්දේසි පිළිගනිමිනි. ඒ අනුව 1998.06.12 සිට වසර පහක් එම ව්‍යාපෘතියෙන් වැටුප් ලබමින් එහි ගණකාධිකාරී ලෙස කටයුතු කර ඇත.

වෛද්‍යරත්න මහත්මිය ඉහත කී ව්‍යාපෘතියේ ගණකාධිකාරී ලෙස සේවය කරන අතරතුර 1999.07.29 වැනි දින එම ව්‍යාපෘතියේ ව්‍යාපෘති සම්බන්ධීකාරක මගින් මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ලිපියක් යවමින් එම අධිකාරියේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්) තනතුරට උසස් වීමක් ලබාදෙන ලෙස ඉල්ලීමක් කර ඇත. ඒ අනුව මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා 2002.03.25 වැනි දින නිකුත් කරන ලද ලිපිය (වී. 3) වෛද්‍යරත්න මහත්මිය 1999.07.15 දින සිට ක්‍රියාත්මක වන පරිදි මහවැලි අධිකාරියේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්) තනතුරේ වැඩ බැලීම සඳහා පත්කර ඇත. 1999.07.15 දින වනවිටත්, ලිපිය නිකුත් කළ 2002.03.25 දින වනවිටත් වෛද්‍යරත්න මහත්මිය සේවය කරමින් සිට ඇත්තේ ව්‍යාපෘතියේ ගණකාධිකාරී හැටියටයි.

ප්‍රතිව්‍යූහගත කරන හා පුනරුත්ථාපන ව්‍යාපෘතියේ සේවය කරන කාලය මහවැලි අධිකාරියේ සම්පූර්ණ සේවා කාලයට ගණනය නොවන බවට ද කොන්දේසියක් පනවමින් 1998.06.12 වැනි දින සිට වැටුප් රහිත නිවාඩු මත එම ව්‍යාපෘතියට මුද හරින ලද වෛද්‍යරත්න මහත්මිය 1999.07.15 වැනි දින සිට නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්) තනතුරේ වැඩ බැලීමට පත් කිරීමෙන් අධිකාරිය කර ඇත්තේ බරපතල වරදකි. කෙසේ වුව ද වෛද්‍යරත්න මහත්මියද පිළිගත් කරුණක් වන්නේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්) තනතුරේ වැඩ බැලීමට පත් කල ද, ඇය මහවැලි අධිකාරියට පැමිණ එම තනතුරේ වැඩ භාරගෙන කටයුතු නොකළ බවයි. ඇය තවදුරටත් 2003 වසර තෙක් සේවය කර ඇත්තේ ප්‍රතිව්‍යූහගත කරන හා පුනරුත්ථාපන ව්‍යාපෘතියේ ය.

ව්‍යාපෘතියේ සේවා කාලය අවසන් වීමෙන් පසු ඇය මුදල් අංශයට අනුයුක්ත කර ඇති අතර කිසිවිටෙකත් නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්) තනතුරේ වැඩ බැලීමට පත්කර නැත. ''වී.12'', ''වී.11'' ලේඛන වලින් පැහැදිලි වන්නේ මුදල් අංශයට අනුයුක්ත කළ වෛද්‍යරත්න මහත්මිය සහකාර අධ්‍යක්ෂ (මුදල්) හැටියට විවිධ අංශවල සේවය කර ඇති බවයි. ''වී.13'' ලෙස ලකුණු කර ඉදිරිපත් කරන ලද ලේඛනය අනුව ඇය 2007.08.01 දින සිට අධ්‍යක්ෂ (සැළසුම් හා මෙහෙයුම්) අංශය වෙත අනුයුක්ත කර ඇති අතර එම අංශයට අනුයුක්ත කර ඇත්තේ සහකාර අධ්‍යක්ෂ (මුදල්) තනතුර යටතේ ය. නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්) තනතුරේ වැඩ බැලීම වෙනුවට ඇය වෙත පවරන ලද අනෙකුත් තනතුරු බාර ගැනීම ඇය ප්‍රතික්ෂේප කර නැති අතර ඊට විරෝධයක් ද දක්වා නැත.

තවද වෛද්‍යරත්න මහත්මිය 2005.03.10 වන දින මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කරන ලද ලිපියක් මගින් වැටුප් රහිත නිවාඩු මත ''ගැමි දිරිය ව්‍යාපෘතියේ'' ප්‍රජා මූල්‍ය කළමනාකරණය පිළිබඳ උපදේශක තනතුර සඳහා මුද හරින ලෙස ඉල්ලා ඇත. ඇයගේ එම ඉල්ලීමට අධිකාරිය ඉඩ ලබානොදුන් බව ''වී.9'' ලෙස ලකුණු කරන ලද ලේඛනයෙන් පැහැදිලි වේ. 2009.12.31 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි වෛද්‍යරත්න මහත්මිය සේවයෙන් විශ්‍රාම ගන්වා ඇති අතර ඒ වනවිට ඇයගේ තනතුර වී ඇත්තේ සහකාර අධ්‍යක්ෂ (මුදල්) ය.

2003 වසරේදී වෛද්‍යරත්න මහත්මිය නැවත මහවැලි අධිකාරියේ සේවයට පැමිණීමෙන් පසු ඇය නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්) තනතුරට පත් නොකිරීමට හේතු වශයෙන් මහවැලි අධිකාරිය දක්වා ඇත්තේ ඇය ඒ වනවිටත් වැඩබලන නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්) තනතුරේ සේවයේ නියුක්ත නිලධාරීන්ට වඩා ජ්‍යෙෂ්ඨත්වයෙන් අඩු මට්ටමක සිටීම හා ඇයට නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්) තනතුරට පත් කිරීමට අවශ්‍ය සුදුසුකම් සපුරා නොතිබීමයි. අධිකාරිය වෙනුවෙන් සාක්ෂි දුන් පරිපාලන නිලධාරිනිය ප්‍රකාශ කලේ බඳවා ගැනීමේ පටිපාටිය අනුව නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්) තනතුරු සඳහා ඒ. සී. සී. ඒ. සහ සී. අයි. එම්. ඒ. සාමාජිකත්වය ලබා තිබීම අවශ්‍ය බවයි. තමාට ඇත්තේ ඊට වඩා අඩු සුදුසුකම් බව වෛද්‍යරත්න මහත්මිය හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් පිළිගත්තාය. (2013.11.29 සාක්ෂි සටහන් - පිටුව 6) වෛද්‍යරත්න මහත්මිය මෙම නඩු විභාගයේ දී ව්‍යාපෘතියේ සේවයට අදළව ලකුණු කර ඉදිරිපත් කරන ලද ලේඛන ඇය ඉල්ලා ඇති සහනයට අදළ වන්නේ නැත.

ඉල්ලුම්කාර වෛද්‍යරත්න මහත්මිය 1998.06.12 දින සිට 2003 වසර තෙක් වැටුප් සහිතව ප්‍රතිව්‍යූහගත කරන හා පුනරුත්ථාපන ව්‍යාපෘතියේ සේවය කර ඇති බව එම මහත්මිය ද පිළිගත් කරුණකි. මහවැලි අධිකාරිය 1999.07.15 වැනි දින සිට නියෝජ්‍ය අධ්‍යක්ෂ

(මුදල්) තනතුරේ වැඩ බැලීමට පත් කළ ද, ඇය ව්‍යාපෘතියේ තනතුරින් ඉවත්ව, නව තනතුර බාර ගැනීමට කටයුතු කර නැත. ඇය ව්‍යාපෘතියේ සේවා කාලය අවසන් කර නැවත මහවැලි අධිකාරියේ සේවයට පැමිණෙන විට නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්) වැඩ බැලීමේ තනතුරේ පුරප්පාඩු පුරවා තිබූ අතර, එසේ කිරීම වරදක් බව නොපෙනේ. වෛද්‍යරත්න මහත්මිය 2003 අධිකාරියේ සේවයට පැමිණීමෙන් පසු 2009 විශ්‍රාම යන තෙක්ම කටයුතු කර ඇත්තේ සහකාර අධ්‍යක්ෂ (මුදල්) තනතුරට පත් කිරීමට අවශ්‍ය සුදුසුකම් ද එම මහත්මිය සපුරා නැති බව සාක්ෂි වලින් තහවුරු විය. කරුණු එසේ හෙයින් 1999.07.15 දින සිට නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්) තනතුරේ පිහිටුවා එදින සිට හිග වැටුප් ලබාදෙන ලෙස කරන ඉල්ලීම යුක්ති සහගත ඉල්ලීමක් නොවන බවට තීරණය කරමි. ඒ අනුව ඉල්ලුම්කාර මාග්‍රට් වෛද්‍යරත්න මහත්මියගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කර ඒ මහත්මිය හා ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය අතර කාර්මික ආරවුල මෙයින් අවසන් කරමි.

නීතිඥ සරත් ලියනගේ,
බේරුම්කරු.

2016 මැයි මස 25 වැනි දින.

09-217

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.